“මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නිරා වාසීන්ට හිමිවන වඩාත් සැහැල්ලු දඬුවම, තම දෙපතුල යට තබන ලද ගිනි පෙණලි දෙකකි. වතුර උතුරා යන්නා සේ ඔහුගේ මොළය එමගින් උණු වී උතුරා යයි. මීට වඩා දරුණු ලෙස දඬුවම් විදින කිසිවකු ඔහු දකින්නේ නැත. සැබැවින්ම ඔවුන්ට හිමිවන සැහැල්ලුම දඬුවම එය වේ.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව නුඃමාන් ඉබ්නු බෂීර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නිරා වාසීන්ට හිමිවන වඩාත් සැහැල්ලු දඬුවම, තම දෙපතුල යට තබන ලද ගිනි පෙණලි දෙකකි. වතුර උතුරා යන්නා සේ ඔහුගේ මොළය එමගින් උණු වී උතුරා යයි. මීට වඩා දරුණු
ලෙස දඬුවම් විදින කිසිවකු ඔහු දකින්නේ නැත. සැබැවින්ම ඔවුන්ට හිමිවන සැහැල්ලුම
දඬුවම එය වේ.”
[صحيح] [متفق عليه]

"මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නිරා වාසීන්ට හිමිවන වඩාත් සැහැල්ලුම දඬුවම වනුයේ, පටි සහිත සෙරප්පු ජෝඩු දෙකකි. තඹ බඳුනක ජලය නටනවාක් මෙන් ඒ දෙකෙහි උණුසුම හේතුවෙන් ඔහුගේ මොළය උණු වී උතුරා යනු ඇත. මීට වඩා දරුණු ලෙස දඬුවම් විඳින කිසිවකු ඔහු නොදකිනු ඇත. සැබැවින්ම ඔවුන්ට හිමිවන සැහැල්ලුම දඬුවම එයයි. එනම් ශාරීරික හා මානසික දඬුවම එකට පවතී." යැයි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) දැන්වුහ.

http://www.sunnah.global/hadeeth/si/show/4220